# පැරණි ග්‍රන්ථ නිෂ්පාදන කලාව හා ඒ ආශ්‍රිතව ඇති වූ ශ්‍රම විභජන ක්‍රියාවලිය: පුස්කොළ පොත් ලේඛන කලාව ඇසුරෙන්

- චම්පා එන්. කේ. අලහකෝන්

සිංහලයාගේ ලේඛන ක්‍රමයේ ආරම්භය පිළිබඳව විමසීමේදී එය ඉතා ඈත අතීතය දක්වා දිව යන බවට සාධක ඇත. ලංකා ඉතිහාසය සම්බන්ධයෙන් ලියැවී ඇති මහාවංශය නම් වූ විශිෂ්ට පුරාවෘත්තයට අනුව, ලේඛන යුගයේ ආරම්භය ක්‍රි. පූ. 500 දක්වා ඈත අතීතය කරා දිව ගියේ වුවද එම වකවානුවට අයත් ලේඛනයක් හෝ ග්‍රන්ථයක් සොයා ගැනීම දුෂ්කරව පවතී. ඒ අනුව ලංකාවේ ලේඛන කටයුතුවල ආරම්භය සොයා ගත හැකි වනුයේ ක්‍රි. පු. 300 දී පමණ සිට වන අතර එය බුදු සමයේ ආරම්භයත් සමඟ බද්ධව පවතී.

එසේ බුදු සමය හා ඇරඹි ලේඛන කලාව, ක්‍රි. ව. 1 සියවස වන විට තල් කොළයේ ලේඛන ගත වීම සිදු වූ අතර එය ශත වර්ෂ 3 ක් හෙවත් වර්ෂ 300ක පමණ කාලයක් මුළුල්ලේ මහා ස්ථවිරවරුන් විසින් මුඛ පරම්පරාගතව රැගෙන එන ලද ත්‍රිපිටක ධර්මය හෙවත් බුද්ධ භාෂිතය සංඝායනා කොට ලේඛන ගත වූවකි. මෙය ලක්දිව මෙතෙක් සිදු වූ පැරණිතම හා විශාලතම ලේඛන සම්ප්‍රදායත්, අක්ෂර වර්ගත් විරාම ලක්ෂණ ආදී ලේඛනය සඳහා යොදා ගැනෙන්නා වූ විවිධ ලක්ෂණත්, ලේඛන මාධ්‍යයත්, ශිල්ප ක්‍රමත් සම්බන්ධයෙන් ස්ථිරසාර තීරණයන්ට එළඹ ඇති අවස්ථාවක් බව පැරණි අත්ලිපි හෙවත් පුස්කොළ ලේඛන විමර්ශනයේ දී පෙනී යයි.

මෙසේ පුස්කොළ හෙවත් තල්පත් ආධාර කොට ගෙන ලක්දිව ලේඛන කටයුතු ආරම්භ කළ අතර පැරණි හසුන්පත් සඳහා බෙහෙවින් ම මෙම තල්පත් භාවිත කරන්නට ඇති බවට මහාවංශය කරුණු දක්වයි. එවැනි හසුන්පත් හා ඒවාට පිළිතුරු පත් ලද බවට ද තොරතුරු රැසක් පැරණි මූලාශ්‍රවල සඳහන් වේ.

මේ අනුව බලන කල පැරණි සිංහල සමාජය පුද්ගල පරිහරණය

සඳහා අවශ්‍ය බොහෝ දේ සම්පාදනය කර ගැනීමට හැකි ශක්තියෙන් සිටි බවත්, ඒ සඳහා උවමනා සම්පත් තම වටපිටාවෙන් හෙවත් අවට පරිසරයෙන් ලබා ගැනීමට පුරුදු වී සිටි බවටත් සාක්ෂි පෙනෙන්නට තිබේ. ආහාර, නිවාස, ඇඳුම් පැළඳුම් පමණක් නොව එදිනෙදා ජීවිතයට අවශ්‍ය අනෙකුත් සෑම සියලු ද්‍රව්‍යක්ම සම්පාදනය කර ගැනීම සඳහා පැරැන්නන් විසින් දේශීය අමුද්‍රව්‍ය භාවිත කර ඇති අතර ලක්දිව ග්‍රන්ථකරණය සඳහා අවශ්‍ය මෙන්ම භාවිත කළ පුස්කොළ පොත් සම්පාදනයට අවශ්‍ය දේශීය අමුද්‍රව්‍ය මෙන්ම ශ්‍රමය ද ලබා ගෙන ඇත්තේ තම අවට පරිසරය ආශ්‍රයෙනි.

ශ්‍රී ලංකාවේ ලේඛන කලාව සම්බන්ධයෙන් කරුණු විමසා බලන විට පුස්කොළයට හිමි වන්නේ අද්විතීය ස්ථානයකි. ක්‍රි. පූ. යුගයේ සිට විවිධ ද්‍රව්‍ය ආධාර කර ගනිමින් ලේඛන කලාව ආරම්භ කළ ලාංකිකයා ඒ සඳහා යොදා ගත් අමුද්‍රව්‍ය රාශියකි. ඒ අතර ගස් පොතු, පට්ටා, ගල් පෝරු, ලී කැබලි, මැටි බඳුන්, තඹ, රන්, ලෝහ, තහඩු, වැටකෙයියා පත් හා තල්පත් හඳුන්වා දිය හැකිය. මේ සියල්ල දේශිය අමුද්‍රව්‍ය පමණක් නොව එවකට භාවිත වුණු හා දැනට භාවිතයේ පවත්නා ලේඛන මාධ්‍යයන්ය. ලිවීම සඳහා භාවිත කළ මෙම මාධ්‍යයන් සම්බන්ධයෙන් විමසීමක යෙදෙන විට පෙනී යන වැදගත් කාරණය නම් ඒ ද්‍රව්‍ය සියල්ලම ස්වභාවයේ පවත්නා ආකාරයෙන් ලේඛන කටයුතු සඳහා භාවිත කිරීමට නොහැකි වීමයි. මේ සියල්ල ලේඛනය සඳහා හෙවත් එහි මතුපිට  අකුරු ලිවීම සඳහා සුදුසු  මතුපිටක් හෙවත් පෘෂ්ඨයක් ඇති වන පරිද්දෙන් සකසා ගැනීමක් හෝ පදම් කර ගැනීමක් සිදු කර ගත යුතුයි. ඒ සඳහා බොහෝ  විට අන්‍ය පුද්ගලයන්ගේ සහාය හා කුසලතාව ද අවශ්‍ය වී ඇති බව පැහැදිලි කාරණයකි. නිදසුනක් ලෙස ලෝකුරුවා, කම්මල්කරුවා හෝ වඩු කාර්මිකයාගේ සහාය සහ දැනුමත් ඔවුන්ගේ ශිල්ප ඥානයත් උපයෝගී කර ගනිමින් මෙසේ භාවිත කරන ද්‍රව්‍ය ලේඛනයට අවශ්‍ය පරිදි සකසා ගත යුතු වේ. ඒ අනුව බලන කල තල්පත්හි ලේඛන කටයුතු සිදු කිරීම වර්තමානයේ මුද්‍රණ වන අභ්‍යාස පොත්හි ලිවීම තරම් පහසු කටයුත්තක් නොවන්නට ඇත. එසේ හෙයින් මෙම ලිපියෙහි මූලික අරමුණ වන්නේ පැරණි ග්‍රන්ථ ප්‍රත්‍යුත්පාදන ව්‍යාපාරය සඳහා බෙහෙවින් යොදා ගත් පුස්කොළය, එහි ලිවීමේ නිමාව දක්වා සකස් කිරීම සඳහා පුස්කොළ කර්මාන්ත

හා අත්‍යාන්තයෙන් බැඳී පැවතියා වූ ශ්‍රමිකයන් මෙන්ම ශ්‍රම විභජන ක්‍රියාවලිය එම කටයුත්තට ඉතා සාර්ථක ලෙස දායක වූයේ කෙසේද යන්න විමසා බැලීමයි.

මේ සම්බන්ධයෙන් මෙතෙක් කලක් කර ඇති පරීක්ෂණ, සමීක්ෂණ වාර්තා හා පළ වී ඇති ලිපි ග්‍රන්ථ ආදිය විමසා බැලීමේ දී පෙනී ගිය කරුණක් නම් පුස්කොළ ලේඛන කලාව සම්බන්ධයෙන් බොහෝ විද්වතුන්ගේ අවධානය යොමු වී ඇතත් එම කර්තව්‍යය සඳහා සහාය වූ තාක්ෂණික ශිල්ප ක්‍රම, උපකරණ හා පුද්ගල සහභාගිත්වය සම්බන්ධයෙන් සාකච්ඡාවට භාජනය වී නොමැති බවයි. කෙසේ වුවද දැනට ලියවී ඇති ලිපි බොහොමයක් ලියැ වී ඇත්තේ ලේඛනය සඳහා තල්පත සකසා ගැනීම, ඒ මත අකුරු ලියන ආකාරය, පුස්කොළ එකතුන්, ඒවාහි විශේෂතා, නාම ලැයිස්තු හා ඒවා අඩංගු හෝ තැන්පත් වී ඇති පන්සල් හෝ ස්ථාන සම්බන්ධයෙන් වන අතර තල්පත ලේඛනය සඳහා යොදා ගන්නා තෙක් සිදුවන සුවිශේෂී ක්‍රියාවලිය හා පුස්කොළ පොතක් වශයෙන් එය නිමහම් වන තෙක් සිදු කෙරෙන්නා වූ නොයෙක් ශිල්ප ශාස්ත්‍ර හා තාක්ෂණික ක්‍රියාවලිය පිළිබඳව වැදගත් ප්‍රාමාණික විස්තරයක් සොයා ගැනීම දුෂ්කරව පවතී. එපමණක් නොව තාක්ෂණික අංශය සම්බන්ධයෙන් බොහෝ වියතුන් අවධානය යොමු කොට ඇත්තේ පුස්කොළ පොත් සංරක්ෂණය හා ආරක්ෂණ ක්‍රියාවලිය සම්බන්ධයෙන් වන අතර ග්‍රන්ථ සැකසීම, අලංකරණය, එහි නිමාව ඒ හා බැඳි ශිල්පීය අංශයෙහි යෙදී සිටියා වූ පිරිස් හා ශ්‍රමිකයන් සම්බන්ධයෙන් මෙන්ම ඔවුන් කුමන ආකාරයේ කර්තව්‍යයන්ගෙන් මෙම නිෂ්පාදන ක්‍රියාවලිය හා සම්බන්ධ වී ද යන්න පිළිබඳ ප්‍රමාණවත් කරුණු ඉදිරිපත් වී නැත.

## තලකොළ ලේඛන ක්‍රමය ආශ්‍රිත ශ්‍රම විභජනය

පුස්කොළ පොතක් සම්පූර්ණ වීම සඳහා අංග 4 ක් අත්‍යාවශ්‍ය වේ. එනම් පොත් කම්බා, ලියූ තල් කොළ, හුය හා සකියා මූලිකව තිබිය යුතුය. එහෙත් මෙම කොටස් 4 සම්පූර්ණ කර ගැනීම සඳහා බොහෝ පුද්ගලයන්ගේ සහාය අවශ්‍ය වේ. සමහර විටෙක තල්පත් එමෙන්ම එහි අකුරු ලිවීම සඳහා භාවිත කළ පන්හිඳත් නොතිබෙන්නට සකල සත්වයා කෙරෙහි පතළ කරුණාවෙන් දෙසා වදාළ බුදු දහමේ

සාරාර්ථය වර්තමානිකයන්ට දායාද නොවන්නට ද බොහෝ සෙයින් ඉඩ තිබිණි. කෙසේ වුවද පැරණි ලේඛන සම්බන්ධයෙන් සඳහන් වන සටහන් තරමට ම ඒ සඳහා භාවිත වූ උපකරණ සම්බන්ධයෙන් පැහැදිලි සටහන් ලැබෙනුයේ ඉතා කලාතුරකිනි.

තල්පත ලේඛනය සඳහා උපයෝගී කොට ගැනෙන්නට ඒ සඳහා වූ අවශේෂ කටයුතු සඳහා අනෙක් පිරිස් හා උපකරණ, කලාශිල්ප, ශිල්ප ක්‍රම ආධාර වූ බව සිතිය හැකිය. මෙහිලා ප්‍රථමයෙන් ම තල්පත් සැකසීම සඳහා තල ගොබය තෝරා ගැනීමේ සිට ඒ සම්බන්ධ වී ඇති ශ්‍රම විභජන ක්‍රියාවලිය කෙසේ දැයි විමසා බැලීම උචිතය.

## පුස්කොළ සඳහා තල් ගොබ තෝරා ගැනීම

තාල වර්ග 205 කින් තල උපකුලකය යටතේ භාවිත වන ගස තල්පත් ලබා ගැනීමට යොදා ගැනේ. එම ගසට අයත් උද්භිද නාමය "Corypha umbraculifera" නම් වේ. මෙම කොළ සිංහලයා අතර ප්‍රචලිත වී ඇත්තේ තල් කොළය හෙවත් පුස්කොළය නමිනි. ග්‍රන්ථ සැකසීම සඳහා භාවිත කරනුයේ නොමේරූ තල ගොබයයි. මේරූ හෝ පමණට වඩා ළපටි තල්කොළ ලබා ගත හොත් තනා ගත් තල් කොළ හෝ පුස්කොළ පොත දීර්ඝ කාලයක් පවත්වා ගැනීමට නොහැකි වේ. එබැවින් මෙහි පළමු අදියර වනුයේ ලේඛනය සඳහා තල් ගොබයක් වෙන් කිරීමට ගස ලකුණු කිරීමයි. මෙය සිදු කෙරෙනුයේ තල් ගස කුඩා කලදීය. ඒ සඳහා දැනුවත් පුද්ගයෙකු ඉදිරිපත් වන අතර එම තල්ගස සලකුණු කර එය ප්‍රමාණවත් ලෙස මේරීමට සැලැස්විය යුතුය. ලේඛන සඳහා තෝරා ගන්නා තල ගොබය නොමේරූ එහෙත් මේරීමට ආසන්නයේ පවත්නා තල් ගොබයක් විය යුතුය. එම ගොබය කැපීම සඳහා චාරිත්‍ර වාරිත්‍ර හෙවත් චිරාගත සම්ප්‍රදායන් පවතී. ඒ සඳහා ශුභ දිනයක් ලෙස සැලකෙනුයේ මාසේ පෝය ලැබීමට දින 2-3 කට පෙර දිනයන්ය. එවන් දිනෙක එනම් රාත්‍රියේ කරුවල වැටීමට පෙර තල් ගොබය කපා ගැනීමෙන් තල් කොළවලට සිදු විය හැකි හානි හා විනාශ ආදිය අවම වන බවට ගැමි ජනයා අතර විශ්වාසයක් පවතී.

මෙම කර්තව්‍යය ගරු සත්කාර ඇතිව සිදු කෙරෙන අතර ඒ සඳහා පංච ශීලයෙහි පිහිටියා වූ පුද්ගලයෙකු යොදා ගැනේ. නැකත් ශාස්ත්‍රයට

අනුව නැකැත්කරුවා විසින් පිරිසිදු නැකතක් සොයා දීමෙන් අනතුරුව මෙම කර්තව්‍යය සිදු කිරීමට තෝරා ගත් පුද්ගලයා වතාවත් අනුව පේවී, පංච ශීලයෙහි පිහිටා, සුදු පිරුවට හැඳ සිය කටයුතු ආරම්භ කළ යුතු වේ. ඒ සඳහා ප්‍රථමයෙන් තල් ගොබය කපන්නා වූ තැනැත්තා ගසෙන් අවසර ගත යුතුය. එසේම තල් ගොබය කැපීමට පෙර දින මල් පහන් පූජා කර වන්දනා මානාදිය පවත්වා ගොබය කැපීමට අවසර පතයි. ඉන් පසු ගොබය කපා ගන්නා අතර එය බිමට නොදමා බා ගැනීමට අවශ්‍ය වේ. එසේ ප්‍රවේශමෙන් කපා ගෙන පහතට බා ගත් ගොබය පුද්ගලයන් කීප දෙනෙකුගේ ආධාරයෙන් කර මතින් තබා ගෙන පංසලට හෝ අදාළ ස්ථානය කරා වැඩම කරවා ගනී. මෙම කර්තව්‍යයන් තුනම සිදු කිරීමේ දී බෙර, තම්මැට්ටම්, දවුල් ගසා කුඩා පෙරහරකින් එම ගොබය අදාළ ස්ථානය කරා රැගෙන යනු ලබයි. මේ අනුව  බලන විට නැකැත්කරු, බෙරකරු හා පැවිදි පුද්ගලයන්, ගිහි පුද්ගලයන් මේ සඳහා සම්බන්ධ වී සිටින බව පෙනේ. පූජනීය කටයුත්තකට හෙවත් ධර්මය, ජෝතිෂ්‍යය වැනි විෂයයන් ලේඛන ගත කිරීම සඳහා මෙම තල් කොළ යොදා ගන්නා බැවින් බෞද්ධ වතාවත් අනුව තදනුගත කර්තව්‍යයන් සිදු කිරීම දක්නට ලැබේ.

මෙසේ කපා ගත් තල් ගොබයක් සාමාන්‍යයෙන් අඩි 10- 20 දක්වා දිග වන අතර එහි අඩංගු තල් කොළ ප්‍රමාණය 80 - 100 පමණ විය හැකි බැවින් එම කටයුතු කිරීම සඳහා කිහිප දෙනෙකුගේ සහයෝගය අවශ්‍ය වන බව නොකිව මනාය. මෙසේ තල්ගොබය තෝරා නියමිත පරිදි කපා නොගතහොත් ඉන්පසුවට සිදු කෙරෙන්නා වූ සියලු කටයුතුවල උපරිම ඵල ප්‍රයෝජනයක් ගත නොහැකි වනවා පමණක් නොව කාලය, ශ්‍රමය හා උපයෝගීතාවද හීන වනවා ඇත.

## ඉරටු ඉවත් කිරීම

මේ සඳහා ද විශාල පිරිසක සහාය අවශ්‍ය වේ. එමෙන්ම මෙහිදී භාවිත වන උපකරණය දැලිපිහිය හා පිහිකටුව වේ. මෙම උපකරණය යකඩවලින් සාදා ඇති අතර එය විශේෂිත වූ උපකරණයකි. එනම් එක් කෙලවරක තියුණු ලෝහ කටුවක් සහ අනෙක් කෙළවර කොළ කැපීමේ පිහි තලයකින් ද සමන්විත මෙම උපකරණය අවශ්‍ය විටෙක එකම කොපුවක බහා හැකිලිය හැකි අන්දමට සාදා ඇත. එම දැලි පිහිය හා පිහි කටුව භාවිත කරමින් කොළ කපා ගැනීම හා තල්

කොළයේ මැද ඉරටුව ඉවත් කර ගැනීම සිදු කරනු ලැබේ.

## වට්ටු සාදා තම්බා ගැනීම

ග්‍රන්ථය සැකසීම සඳහා කපා ගත් තල් කොළ තම්බා ගැනීමට අවශ්‍යය. මේ සඳහා ඉරටු ඉවත් කරන ලද තල්කොළ රවුම් දරනු ආකාරයට ඕතමින් රෝලක් මෙන් සාදා ගත යුතුය. මේවා වට්ටු නම්. මෙයද බෙහෙවින් කාලය හා ශ්‍රමය වැය වන කටයුත්තක් වන අතර එසේ සාදා ගත් වට්ටු තම්බා ගත යුතුය. එසේ තම්බා ගැනීමේදී ඒ සඳහා යොදා ගැනෙන ඖෂධීය වටිනකමකින් හා ගුණයකින් හෙබි ශාඛමය ද්‍රව්‍ය බොහොමයක් යොදා ගනී. ඒවා එක් ප්‍රදේශයෙන් ප්‍රදේශයට වෙනස් වන අතර සොයා ගැනීම සඳහා ද වෙහෙසිය යුතුය. එබැවින් එම කළමනා එකතු කර ගැනීම සඳහා ද වෙහෙසිය යුතු අතර එම කළමනා එකතු කර ගැනීම සඳහා පිරිස් ද අවශ්‍ය වේ. එමෙන්ම මේ සඳහා අවශ්‍ය ද්‍රව්‍ය එකම පරිසරයකින් ලබා ගැනීමට ඇති නොහැකියාව නිසාම මේ සඳහා කැප වී සිටි පිරිසක් වූ බවටද වාර්තා වේ. ගම්මුන්ගේ සහායට අමතරව, පුස්කොළ හෙවත් තල් කොළ සැකසීම ව්‍යාපාරයක් වශයෙන් සිදු කරන ප්‍රදේශයන්හි මේ සඳහා යොදා ගැනෙන අමුද්‍රව්‍යය නම් නොමේරු අන්නාසි කොළ, පැපොල් කොළ හා පැපොල් ගැට, බෙලි කොළ හා ගෙඩි, කැප්පෙටියා කොළ හෝ පින්න කොළ, බෝඹු කොළ, වී කරල්, පිරිසිදු ජලය, තඹ හැලියක් හා ලී කෝටු කිහිපයක් ද අවශ්‍ය වේ. නොයෙක් දෙනාගේ සහයෝගයෙන් සොයා ගත් මෙම ද්‍රව්‍ය ඉන් පසු කුඩා කැබලිවලට කපා ගැනීමට අවශ්‍ය වේ. අනතුරුව තෝරා ගත් තඹ මුට්ටියෙහි වට්ටු හා මෙම ඖෂධීය ද්‍රව්‍ය තට්ටු ක්‍රමයට අසුරා ඒ මත කෝටු කැබලි අසුරා ගත යුතුයි. එසේ සිදු කිරීමෙන් වට්ටු තැම්බෙන විට මුට්ටිය උඩට ඒම වැළකේ. ඒ සඳහා ලී කෝටු මත බරක් ද තබා ගත යුතුවේ. ඉන් පසු මෙසේ තම්බා ගත් කොළ දිග හැර වේලා ගත යුතු වේ.

## තල්කොළ වේලා ගැනීම

මේ සඳහා වට්ටු ලෙස සැකසූ තල කොළ දිග හැර ගත යුතුය. ඉන් පසු ඒවා නූලක හෝ වැලක එකිනෙක නොගැටෙන ලෙස එක් කොණකින් අල්ලා ගැට ගසා ගත යුතුය. එසේම ඒවා දින 03 ක්

පමණ හෝ වැඩි ගණනක් මද පවනේ දමා වේලා ගත යුතුය. නැවතත් මෙසේ වේලා ගත් තල්කොළ, විෂ්කම්භය අඩියක් පමණ වන සේ වට්ටු ලෙස ඔතා ගත යුතු වේ. මෙසේ ඔතන ලද දරනු දින 03 ක් පමණ පින්නට දමා පදම් කළ යුතුය. මෙසේ පින්නේ දමන විට කළ යුතු වැදගත් කාර්යයක් වනුයේ සවසට එම කොළ තෙමීමත් නැවත උදෑසන සෝදා වට්ටු ගැසීමෙන් කොළවල ඇති වී ඇති උස් පහත් තැන් සම වී, ඇද නැති වී සම මට්ටමකට පත්වීමයි.

මෙම කර්තව්‍යන් දෙස විමසා බලන විට පෙනී යන වැදගත් කරුණක් වන්නේ එක් තල් ගොබයක් සකසා ගැනීම සඳහා විශාල ශ්‍රමයක් වැය කිරීමට සිදු වීමයි. මෙසේ සැකසූ තල්කොළ ලිවීම සඳහා භාවිතයට නොගන්නේ නම් ඒවා නැවත දරනු ගසා දුමක තැන්පත් කර ගත යුතුය. එසේ තැන්පත් කිරීමෙන් ආරක්ෂා වන අතර කොපමණ කලක් වුව තබා ගත හැකි වේ.

## තල්කොළ පදම් කිරීම

තම්බා ගත් තල් කොළ භාවිතයට ගන්නේ නම් ඒවා පදම් කර ගත යුතුය. පදම් කරනවා යනු ලේඛනය සඳහා සුදුසු මතුපිටක් හෙවත් පෘෂ්ඨයක් ලබා ගැනීමයි. ඒ සඳහා සිනිඳු පෘෂ්ඨයක් ඇති ලීයක ආධාරයෙන් තල් කොළ මැද ගත යුතුය. එයට පුවක්, ගැඩුම, රුක් අත්තන හෝ වෙලන් වැනි දැව සොයා ගත යුතුය. එම දැව කඩා නොවැටෙන පරිදි ලී ආධාරක මත රඳවා ගැනීම හෝ ගස් දෙකක් මත රඳවා බැඳ ගත යුතුය. ඉන්පසු තල් කොළයේ එක් පසෙක බරක් ඇති ගලක් හෝ ගඩොලක් ගැට ගසා අනෙක් පස අතින් අල්ලා ගත යුතුය. මෙය මිදින ගල පඩිගල නමින් හඳුන්වනු ලැබේ. පුස්කොළ මිදින ගස හඳුන්වනු ලබන්නේ හේම කඳ යනුවෙනි. මෙහි මැදීමෙන් තල්කොළය හේම වන බැවින් ඒ නාමය ඊට අනුරූත් වේ.

වෙහෙර, විහාර, පංසල් ආශ්‍රයෙන් මෙම කටයුත්ත සිදු කෙරෙන විට කුඩා ස්වාමින් වහන්සේලා මහත් උනන්දුවෙන් එම කටයුතු සඳහා සහයෝගය ලබා දේ. එසේ නොවන විටක ඒ සඳහා දැනුමැත්තන්ගේ සහාය අවශ්‍ය වේ. එක් කොළයක දෙපස මැද ගැනීම සඳහා අවම

වශයෙන් 50-100 වතාවක් පමණවත් කොළය හේම කඳ මත ඉහළට පහළට ඇද ගත යුතුය. එසේ හෙයින් එම කර්තව්‍ය සඳහා කාලය, ශ්‍රමය, හා පිරිස් බලය අධික ලෙස වැය වන කටයුත්තක් බව පෙනේ. එසේ කොළ මදින විට රත් වීමෙන් ලිවීමට සුදුසු මට සිළුටු සිනිඳු පෘෂ්ඨයක් ලබා ගත හැකිය.

## තල් කොළය කපා ගැනීම

තල් කොළය ශාස්ත්‍රීය කටයුත්තට අවශ්‍ය වන පරිදි දිග හා පළල සහිතව සිව් පැත්තම කපා ගත යුතුය. දැනට නිපදවී ඇති පුස්කොළ ග්‍රන්ථ පරීක්ෂා කරන විට පෙනී යන කාරණයක් නම් වැදගත් ග්‍රන්ථ සියල්ල දිග අඟල් 6 - 32 දක්වාත් පළල අඟල් 02, 2 3 /4 දක්වාත් කපාගෙන ඇති බවයි. ඒ හැර ඉතා කුඩා හෙවත් දිගින් අඩු පුස්කොළ පොත් තිබිය හැකි වුවද ඒවා එතරම් ශාස්ත්‍රීය වටිනාකමක් ඇති තොරතුරු ලිවීම සඳහා භාවිත කර නැත. තල් කොළ පොතට අවශ්‍ය ප්‍රමාණයට කැපීම සඳහා ඒ සඳහා සකසා ගත් අච්චු ඇත. මේවා හුදෙක් ලීයෙන් තැනුවේ වෙයි. ඒ අනුව මෙම අච්චු තනා ගැනීම සඳහා වඩු කාර්මිකයන් ද සහාය කර ගෙන ඇති බව පෙනේ. තල් කොළ කිහිපයක් මෙම අච්චුවට මැදි කොට ගෙන අවශ්‍ය දිග සනිටුහන් කොට ගෙන කපා ගනී. මෙහිදී තල් කොළයේ දෙපස එනම් මැදීමේ දි බරක් එල්ලූ පසු හා අනිත් පස එනම් අතින් අල්ලාගත් කොන සිහින් බැවින් එම දෙපසම ග්‍රන්ථ ලිවීම සඳහා යොදා නොගැනේ. මෙසේ තල් ගොබයකින් තල්කොළ 100-200 ක ප්‍රමාණයක් එකවර කපා ගත හැකි වේ. දළ වශයෙන් ගත් කල පිටක ග්‍රන්ථ සඳහා වියත් 3 ක් ද කේන්ද්‍ර වැනි කටයුතු සඳහා අඩි 4 ක දිගින් යුක්තව ද තල් කොළ කපා ගැනීම සිදු වේ. ඉවත් වන පුස් කොළ කැබලි වෙද සීට්ටු, වෙද පොත් වැනි විෂයයන් ලිවීම සඳහා භාවිත කෙරේ.

අවශ්‍ය ප්‍රමාණයට තල් කොළ කැපූ පසු කොළයේ ඉතිරි වී ඇති නූල් වැනි කෙදි ඉවත් කර ගැනීම සඳහා තල් කොළ නිමහම් කිරීම කළ යුතුය. නිමහම් කිරීමේ දී වටේට ඇති වී ඇති නූල් වැනි කෙඳි පුළුස්සා ගනී. ඒ සඳහා රත් වූ යකඩයක් භාවිත කෙරේ. එය පත්තුල නම් එම යකඩය රත් කර කපා ගත් කොළ වටේ ගෑමෙන් හෙවත් ඇතිල්ලීමෙන් තල් කොළයෙන් ස්‍රාවයක් නිකුත් වී නූල් වැනි කෙඳි

ඉවත් වී පොත වටේට ආරක්ෂිත නිමාවක් ලබා දේ මෙය "රතගැම" නම් වේ.

## සිදුරු විද ගැනීම

සාදා ගත් තල්කොළවල සිදුරු විද ගැනීම උවමනාය. මේ සඳහා උල්ව තනා ගත් යකඩ කටුවක් භාවිත කෙරේ. සිදුරු විද ගැනීම සඳහා අනුගමනය කරන ක්‍රමවේදයක් ඇත. ඒ සඳහා වරක් සමාන කොටස් 03 කට නවාගත් තල් කොළය දිග හැර නැවත වරක් සමාන කොටස් 04 කට නවා ගත යුතුය. ඉන් පසු දිග හරින ලද පත් ඉරුවෙහි 3 සහ 4 නැවුම් අතර සුළු පරතරය මධ්‍යයෙහි සිදුර විදීම සිදු කරනු ලැබේ. ඉන් පසු කපා ගත් සිදුර වටා රත් වූ යකඩ කටුවකින් පුළුස්සා ගනී. මේ ආකාරයට සිදුරු 02 ක් විද ගැනීම සිදු කරයි. සිදුරු විද ගැනීමෙන් ඉවත් වන රවුම් කැබලි සඳහා "කරස්" යන නම භාවිත වේ.

මේ ආකාරයට කොළ තම්බා, පදම් කරගෙන සාදා ගත් තල් පත් ඉරු එකට එකතු කර ගත් විට එය "පුහු පොත් ගෙඩිය" නමින් හඳුන්වනු ලැබේ. එනම් සිදුරු විද සාදා ගත් තල් කොළයි. කිසිවක් නොලියූ බැවින් පුහු හෙවත් හිස් යන අර්ථයෙන් මෙම නම භාවිත කරයි. බොහෝ කර්තව්‍යයන් මේ සඳහා සිදු කළ ද ග්‍රන්ථය තැනීම, නිමා කිරීම සඳහාත් තල් කොළවලට ආරක්ෂාව සැපයීම සඳහාත් එයට සුදුසු ආරක්ෂිත ආවරණයක් පිළියෙල කර ගත යුතුය. එනම් තල් කොළවලට සුදුසු පිට කවරයක් සාදා ගත යුතුය.

## පුස්කොළ පොත සඳහා කම්බා සාදා ගැනීම

සාදාගත් තල් කොළ එකතු කොට පොතක් වශයෙන් පිළියෙල කිරීමේදි ඒ සඳහා කවරයක් හෙවත් ආවරණයක් යොදා ගත යුතුය. මෙය "කම්බා" නමී. මෙම කම්බා යනු බොහෝ විට ලී ආධාරයෙන් තනා ගත් කවරයකි. එය තල කොළවලට සිදුවිය හැකි හානිවලින් සහ සීරීම් ඉරීම්වලින් වලකා ගැනීම සඳහා සවි කර ගන්නා ලී පතුරු 2 ක් ලෙසද හඳුන්වා දිය හැකිය. මෙම කම්බා සකස් කර ගැනීම ද පහසුවෙන් කළ හැකි කටයුත්තක් නොවේ. ඒ සඳහා තද අරටුවක් සහිත ලී සොයා ගත යුතුය. කළුවර, ගම්මාලු, වල් සපු, කොස්, මිල්ල,

නා, තේක්ක, මෙන්ම ලෝහ ආදියෙන් ද තනා ගත් කම්බා දැකිය හැකිය. මෙම කම්බා සැදීමේදී තල් කොළවල ප්‍රමාණයට අනුව මිමි ලබාදිය යුතුය. ඉන් පසු හොඳින් ඔප මට්ටම් කරගත් කම්බා සාදා ගත යුතුය. යොදාගත් කම්බා හේතුවෙන් තල් කොළවලට පලුදු හෝ සීරීම් ආදිය නොවිය යුතුය. මේ අනුව මේ සඳහා වඩු කාර්මික ශිල්පීන්ගේ සහාය ලබා යුතු අතර ලීවලට අමතරව රන්, රිදී, ලෝහ, ඇත්දළ, ඉබි කටු ආදියෙන් ද ඉතා මනරම් කැටයමින් යුත් කම්බා සකස් කර ගැනේ. ඒ අනුව බලන කල වඩු කර්මාන්තය පමණක් නොව වෙනත් සුළු කලා කාර්මිකයන්ගේද සහයෝගය මේ සඳහා ලබා ගෙන ඇති බව පෙනේ.

එපමණක් ද නොව බොහෝ පුස්කොළ පොත් කම්බාවල ලාක්ෂා කර්මාන්තය ආශ්‍රිත කලා නිර්මාණද දැකිය හැකිය. මේවාට අමතරව තෙල් සායම්, පොලිෂ් මෙන්ම වර්තමානයෙහි ලැකර් වැනි දේ භාවිත කරමින් ඉතා සියුම් හා අලංකාර නිර්මාණයන්ගෙන් යුත් කම්බා මෝස්තර සකසා ගෙන ඇත. එමෙන්ම කම්බා මතුපිට ඉතා අලංකාර චිත්‍ර, මෝස්තර, ලාක්ෂා, චක්‍ර රේඛා, සිතුවම්, වැනි නිර්මාණ ද දැකිය හැකිය. මල්කම්, ලියකම්, කැටයම්, සත්ව රූප මෙන්ම ග්‍රන්ථයේ විෂයට අනුකූලව වන පරිදි මිනිස්, සත්ව, දේව රූප, යක්ෂ රූපත්, වෘක්ෂ ලතා, මල්, ජ්‍යාමිතික රූප, වගු, සැලසුම් යන්ත්‍ර, යනාදියත් ග්‍රන්ථ අන්තර්ගතයෙහි දැකිය හැකි වේ.

එපමණක් ද නොව සමහර කම්බාවල මැණික් ආදී ගල් ඔබ්බවා අලංකාර කර ඇති අතර ඒවා වටිනා මැණික් ගල්වලින් හා අර්ධ වටිනාකමින් යුත් ගල් වර්ගවලින් ද හැඩ දමා ඇත. මේ අනුව වඩුවන්, ලෝකුරුවන්, සුළු කලා කාර්මිකයන්, ලෝහ, පිත්තල කර්මාන්තයෙහි යෙදෙන්නන් හා චිත්‍ර ශිල්පීන් ඇතුළු බොහෝ කලාත්මක අංශවල කලා ශිල්පීන්ගේ සහයෝගය මේ සඳහා ලබා ගෙන ඇති බව කම්බා පිරික්සීමේ දී පෙනී ගිය කරුණකි. තල් කොළවල මෙන් කම්බායෙහිද අවශ්‍ය තන්හි සිදුරු විද ගැනීමට අවශ්‍ය වේ.

## තල්පත් මත ලිවීම

මෙසේ සියලු කාර්යයන් නිම කර ගත් පසු පුහු පොත් ගෙඩිය මත ලිවීම ආරම්භ වේ. මෙම අවස්ථාව ද සුභ මුහුර්තයෙන් සිදු කෙරෙන

බැවින් නැකත් බලා ශුභ දිනයක්, වේලාවක් ඒ සඳහා යොදා ගත යුතුය. මෙසේ නොයෙක් ක්‍රමවේදයන් හා ශිල්ප ක්‍රම භාවිතයෙන් සාදා ගත් තල්පත් මත බොහෝ විට ලිවීමේ කටයුතු සිදු කරනු ලබන්නේ ස්වාමින් වහන්සේලා විසින්ය. එයට හේතුව නම් එවක ලංකා සමාජයේ ධර්ම ප්‍රචාරක කටයුතු සියල්ලම පාහේ රැඳී තිබුණේ පිරිවෙන් ආශ්‍රිතව වීම නිසා, පුස්කොළ මත පිටපත් කොට එම ධර්මය ප්‍රචාරය කිරීම සඳහා සහයෝගය දැක්වූයේ ස්වාමින් වහන්සේලා හෙවත් පැවිදි පක්ෂයයි. එබැවින් අද ද බොහෝ අවස්ථාවන්හි දී පුස්කොළ පොත්හි ලේඛන කටයුතු සිදු කරනුයේ පැවිදි පක්ෂය විසින්ය.

පුස්කොළ ලේඛනයන්හි ලිවීම සඳහා භාවිත වන උපකරණ දෙකකි. ඒ උල්කටුව හා පන්හිඳයි. ලේඛන කලාවට ආධුනිකයින් විසින් භාවිත කරනු ලබන්නේ උල් කටුවයි. එය තරමක් මොට හෙවත් තියුණු නොවූ උපකරණයකි. එසේම එය කැටයම් ආදියෙන් තොරව තනා ගත්තකි. ඉන් බලාපොරොත්තු වනුයේ තල් කොළය මත අකුරු ලිවීම සඳහා හුරුවක් ලබා ගැනිමයි. ඒ අනුව පුහුණු කරවන්නන් හා පුහුණු වන්නන් යන දෙපිරිසක්ද සිටිය යුතු අතර පුහුණු කරවන්නන් විසින් උල් කටුව තල් කොළය මත හසුරුවන ආකාරයත් එය කොතරම් ගැඹුරට තල්පත මත රැඳවිය යුතු ද යන්නත් පුහුණු කරවිය යුතුය. මෙය බොහෝ විට පංසල් පිරිවෙන්හි නායක ස්වාමින් වහන්සේලා ආශ්‍රිතව සිදු කෙරෙන කටයුත්තකි.

පන්හිඳ භාවිත කරනුයේ පුහුණු වූවන්ය. එය තියුණු එමෙන්ම වානේ ලෝහයෙන් සැදුණු උපකරණයෙකි. එහි අග කොටස බරකින් යුත් ඡත්‍රයකින් නිමහම්ය. ලංකාවේ දැනට දක්කට ඇති පන්හිද බොහොමයක් ලෝහයෙන් සැදුණේ වෙයි. මෙය කිසියම් ලෙසකට ප්‍රමාණවත් බරක්, දිගක්, හැඩයක් හා නිමාවක් සහිතව සැදි උපකරණයක් වූ අතර එය ලේඛනය සඳහා භාවිත කිරීමේ දී සමබරතාවකින් යුක්තව තල්පත මත හැසිරවිය හැකි ආකාරයට සැදුනේ වෙයි. එබැවින් මෙය තම සිතැගි අනුව උවමනා පරිදි නිර්මාණය කරගත නොහැකි අතර සාමාන්‍යයෙන් මෙහි දිග අඟල් 10- 20 අතර පවති. එසේම එහි අනිවාර්ය කොටස් 5 ක් අන්තර්ගත වේ. ඒවා නම් ඡත්‍ර, පත්‍ර, නළ, ගන්ධම් හා ලේඛනීය වශයෙනි. රනින්,

රිදියෙන්, තඹ හා පිත්තලෙන් තැනූ පන්හිඳ දැකිය හැකි වුවත් ලිවීමේ කොටස හෙවත් ලේඛනිය සෑම විටම වානේ ලෝහයෙන් තැනුවේ වෙයි. පන්හිඳ හා තල්කොළ භාවිතයට ගෙන, තල්කොළ මත ලිවීම සඳහා කුඩා මේසයක් ද භාවිත කෙරේ. එය බූරු ඇඳක ආකාරයට කුඩා ලී පතුරු ආදියෙන් සාදා ගන්නා වූ පොත් රඳවනයකි. මෙය "දණ්ඩාසනය" නම්. පුස්කොළ පොත මේ මත තැන්පත් කොට, දණ්ඩාසනය වසා තබන රෙදි කැබැල්ල "බණ්ඩස්නය" නම්.

## පුස්කොළ පොත බැඳ ගැනීම

මෙසේ ලියා ගත් පුස්කොළ පොත් නිෂ්පාදනයෙහි අවසාන කාර්යය වී ඇත්තේ ලියා ගත් තල් කොළ හා සකසා ගත් කම්බා රැඳවීමට නූලක් භාවිත කොට එය පොතක් ලෙස බැඳ ගැනීමයි. මෙම කර්තව්‍යය ද විසිතුරු ලෙස සිදු කර ඇත. මෙම හුය හෙවත් නූල නිපදවා ඇත්තේ හණ, පට්ටා, නියඳ වැනි කෙඳි එකතු කොට හැඩයකට වියා ගැනීමෙනි. රටා සහිතව ගොතා ඇති මෙම නූල රතු හා නිල් වර්ණ මිශ්‍රිතව අලංකාර ලෙස වියා ඇත. ඒ සඳහා ද දැනුවත් පුද්ගලයන් සිටි අතර මෙම නූල කිසිවිටෙකත් අඹරවා වියා ගැනීමක් සිදු කර නැත. එසේ සකසා ගත් නූල තල් කොළ සිදුරු හා කම්බා සිදුරු අතරින් මතු කොට ගෙන කම්බා හා තල් කොළ අවශ්‍ය පරිදි තද කර ගෙන ගැට ගසා ගනී. මෙම නූල පුස්කොළ පොතේ ගැට ගැසීම සඳහා ද ක්‍රමවේදයක් පවතී. එසේ ගැට ගැසීමෙන් තල් කොළ ලිස්සායාම වළකී.

## පොත් සකියා

පොත බැඳීම සඳහා සකසා ගත් නූලෙහි, එක් කොනක් ඉදිරිපස කම්බාවෙන් ඇතුල් කොට ඉන් පසු තල්පත්වලින්ද ඇතුල් කොට අවසානයෙහි පිටුපස කම්බාවෙන් මතු කොට ගෙන ක්‍රමවත්ව ගැට ගසා ගනී. එහෙත් ඉදිරිපස කම්බයෙන් නූල ඇතුළු කොට ගත් පසු යම් හෙයකින් ග්‍රන්ථ පරිශීලනයේ දී කම්බාවෙන් ලිස්සා ගැලවී යාමට ඉඩ ඇති හෙයින් එය වැළැක්වීම සඳහා කම්බයෙන් මතුපිට ඇති නූලෙහි අගට කිසියම් ආධාරකයක් යොදා ගනී. මෙය "පොත් සකියා" නමි. මෙම පොත් සකියා ද නොයෙක් හැඩයන්ගෙන් නිර්මාණය කර

ගෙන ඇත. මේ සඳහා අර්ධ වටිනාකමක් ඇති මුතු මැණික්, රන්, රිදී, පස්ලෝ ආදියෙන් තනා ගත් සකියා දැකිය හැකි වේ. මේ හැර පරණ කාසි, පළිඟු, කැටයම් කළ කළුවර ලී කැබලි, වෙනත් වටිනා අලංකාර ලී හා වැඩ දැමූ අංග සහිත ඇත්දළ, හම්, පොල් කටු හා මී අං ආදිය ද යොදා ගෙන ඇති බව පෙනේ. මෙය කුඩා අංගයක් වුව ද එයත් විසිතුරු ලෙස සැදුණේ වෙයි. සමහර විටෙක රන් රිදීයෙන් හා පිත්තලෙන් නෙළුම්මල් ආකාරයට සාදා ගත් සකියා මධ්‍යයෙහි මැණික් හා නොයෙක් විසිතුරු ගල් ඔබ්බවා තිබීම ද දැකිය හැකිය. මේවා හැඩයෙන් රවුම්, පැතලි, පිම්බූ හෝ ඕවලාකාර වශයෙන් නිර්මාණය වී ඇත. පුස්කොළ පොත සම්පූර්ණ වීමට අවශ්‍ය කුඩාම අංගය මෙය වුවද ඒ සඳහා ද විශාල ශ්‍රමයක් හා කාලයක් වැය කොට ඉතා අලංකාරව තනා ගෙන ඇති බව පෙනේ. තවද කම්බ මතු පිට පෘෂ්ඨයට කිසි විටෙකත් හානි නොවන පරිදි එහි ඇති චිත්‍ර ලියකම් ආදිය සඳහා ද බලපෑමක් ඇති නොවන ලෙස ඉතා සුමට අයුරින් නිමකර ඇත.

මේ ආකාරයට කම්බා, තල්කොළ, හුය, සකියා යොදා ග්‍රන්ථය නිෂ්පාදනය කර ගැනීමෙන් අනතුරුව එහි ලියූ අකුරු කියවීම සඳහා ද පහසුකම් සැලසිය යුතු වේ. ඒ සඳහා පන්හිදෙන් ලියූ හෙවත් සීරීමට ලක්කළ අකුරු කියවිය හැකි පරිදි මතු කර ගැනීමට අවශ්‍ය වේ. මෙයද සැලකිය යුතු විශේෂ ක්‍රමවේදයක් වන අතර එසේ අකුරු මතු කර ගැනීම "කළු මැදීම" වශයෙන් හඳුන්වනු ලැබේ.

## කලු මැදීම හෙවත් අකුරු මතු කර ගැනීම

මෙය ද පුස්කොළ ලේඛන නිෂ්පාදන ක්‍රියාවලියේ ඉතා වැදගත් අවස්ථාවක් වශයෙන් හඳුනා ගත හැකිය. මන්ද යත් ග්‍රන්ථයේ කල් පැවැත්මත්, කියවීමට හැකියාවත් ලැබෙනුයේ එම පුස්කොළ පොත කලු මැදීමෙන් අනතුරුවය. එසේ කලු මැදීම සඳහා දුම්මල තෙල් ඇතුළු නොයෙක් තෙල් වර්ගත් වෙනත් අඟුරු හා ඖෂධීය වටිනාකම් ඇති ද්‍රව්‍යයත් භාවිත කරනු ලැබේ. ප්‍රදේශයෙන් ප්‍රදේශයට මෙම තෙල් සිඳ ගැනීමේ විවිධතා පැවතිය ද දුම්මල තෙල් ඒ සඳහා අත්‍යවශ්‍යයෙන් යොදා ගැනේ.

දුම්මල තෙල් සිඳ ගැනීම සඳහා විවිධ ද්‍රව්‍ය අවශ්‍ය වේ. හල් දුම්මල, දුං දුම්මල 2/3 ක අනුපාතයක්, කැකුණ හා දිවුල් ගසෙන් ලබා ගන්නා ලාටු 1/3 ක් සමග මිශ්‍ර කර මෙම දුම්මල තෙල් සිඳ ගනු ලැබේ. කුඹුරු හා ගං ඉවුරුවලින් ලබා ගන්නා මෙම දුම්මල බිඳ ගන්නේ බදාදා හා සෙනසුරාදා යන දිනයන් හි බවටද චාරිත්‍රයක් ඇත. සමහර ප්‍රදේශයක මී තෙල් ද මේ සඳහා එකතු කරගෙන ඇත. ඒ අනුව මෙයට අවශ්‍ය තෙල්, ඇට, දුම්මල ආදිය සොයා ගැනීමට විවිධ පුද්ගලයන්ගේ සහාය ලබා ගත යුතුවේ. තවත් විටෙක දේවදාර මුල්, දිවුල් මුල්, ගොරකා මැලියම් ද මේ සඳහා යොදා ගත් බව පෙනී යයි. එපමණක් නොව ඇත් දෙමට හා සැවැන්දරා මුල් ද තෙල් සිඳීමට යොදා ගැනේ. මේ සියල්ල මැටි මුට්ටියකට දමා එහි කට මැටිගසා හොඳින් වසා තදින් ගිනි රස්නය ලැබෙන සේ ගිනි අවුලුවනු ලැබේ. ඉන් පෙර මේ සඳහා යොදා ගන්නා මුට්ටියේ කටට පහළින් සිදුරක් විද පැපොල් හෝ උණ බටයක් සවි කර ගත යුතුය. එම සිදුර වටාද මැටිගසා වසා ගත යුතුය. කෙළවර පිරිසිදු භාජනයක් ද තබා ගත යුතුවේ. ඉන් පසු අවශ්‍ය උෂ්ණත්වයට රත් වූ පසු දුම්මල තෙල් පැපොල් හෝ උණ බටය දිග වෑස්සී තබාගත් භාජනයට එකතු වේ.

මෙසේ එකතු කර ගත් දුම්මල තෙල් සමග ගැඩුම ගසේ අඟුරු මිශ්‍ර කර ගැනේ. එනම් ගැඩුම කෝටු දැවුණු අඟුරුය. මේ අතර දුම්මල තෙලට පැඟිරි හා දොරණ තෙල් ද එකතු කෙරේ. මේ සියල්ල නිසා ඖෂධීය ගුණයෙන් හෙබි සැර සුගන්ධවත් තෙලක් ලබා ගත හැකිය.

මේ අන්දමට සකස් කර ගත් වෙළඳ පොළෙන් සොයා ගත නොහැකි හෙයින් මෙය අදටත් පුස්කොළ පොත් සාදන ගම්වලටම ආවේණික වූ ක්‍රියා දාමයක් වශයෙන් පවත්වාගෙන යනු ලැබේ. මිශ්‍ර කර ගත් දුම්මල තෙල් සහ ගැඩුම අඟුරු කපු රෙදි කැබලි භාවිත කරමින් ලියන ලද තල් පත් මත හොඳින් විසිරී යන පරිදි මැද ගත යුතුය. පන්හිඳෙන් කැපුණු අකුරු මතට මෙසේ තෙල් හා අඟුරු මිශ්‍රණය කා වැදීමෙන් ඒවා හොඳින් තල් කොළයට උරා ගනී. ඉන් පසු අවශේෂ තෙල් පිස දමා ගත යුතු වේ. ඒ සඳහා පිරිසිදු කපු රෙදි කැබැල්ලක් භාවිත කළ හැකිය. ඉන්පසු පත් ඉරු වේලීමට තබා ගනී. මෙසේ දුම්මල තෙල් හොඳින් උරා ගැනීමෙන් අනතුරුව තල්

කොළයට නව ප්‍රාණයක්, නිමාවක් ලැබේ. මෙසේ තල්පත් සියල්ල කලු මැද ගැනීම සඳහා පුහුණුව ලත් ශිල්පියෙකුගේ සහාය හා මග පෙන්වීම අත්‍යවශ්‍ය වේ. මෙම දුම්මල තෙල් මිශ්‍රණය පදමට ගෙන ක්‍රමවත්ව තල්පත් හි ආලේප කර ගැනීමෙන් ග්‍රන්ථයට සිදුවිය හැකි කෘමි උවදුරු වැනි හානි බොහෝමයක් වළකා ගත හැකි අතර තල කොළයට නම්‍යශීලි භාවයක් ද එමගින් ඇති වේ. එමෙන්ම කල් පැවැත්ම දීර්ඝ වේ. පුස්කොළ ග්‍රන්ථ කාලාන්තරයක් තිස්සේ පැවත ඒමේ රහස ද එයයි.

මෙසේ කලු මැදගත් තල් කොළය හොඳින් පිරිසිදු කර ගෙන සුදු මැදීම කළ යුතුය. එනම් මෙහිදී සිදු වන්නේ අවශේෂ තෙල් හා අඟුරු ඉවත් කොට භාවිත කළ හැකි පරිදි තල් කොළය පිරිසිදු කර ගැනීමයි. මෙයට හලා ගත් කුරක්කන් පිටි, දහයියා පොතු ආදිය යොදා ගැනේ. මෙම ද්‍රව්‍ය තල්පත් මත දමා හොඳින් පිස ගැනීමෙන් ඉතිරි වී ඇති අවශේෂ තෙල් ආදිය ඉවත් වීම නිසාවෙන් තල් කොළ එකිනෙකට ඇලවීම ආදියෙන් වළකා ගත හැකි වේ. මෙසේ සුදු මැද ගැනීම යනු තල් කොළයේ අකුරු මතු කර ගැනීමේ ක්‍රියාවලියේ අවසාන කටයුත්ත වේ. මෙසේ සකසා ගත් පුස්කොළ පොත කියවීම සඳහා හෝ ගබඩාකරණය සඳහා යෝග්‍ය වේ.

## පුස්කොළ පොත් ආවරණය සඳහා ලේන්සු සකස් කිරීම

පුස්කොළ ග්‍රන්ථ ගබඩාකරණය සඳහා සූදානම් කිරීමේ දී ඒවා ලේන්සුවක ඔතා ගනී. මේ සඳහාම විශේෂිත වූ ලේන්සු නිෂ්පාදනය වී ඇති බව පැරණි ග්‍රන්ථ පරික්ෂාවේදි පෙනී යයි. මේ සඳහා යොදා ගැනෙන්නේ කපු රෙදි වන අතර එය චතුරස්‍රාකාර හැඩයක් ගනී. මෙහි එක් කොණක පටියක් හෙවත් එම රෙද්දෙන්ම තනා ගත් නූලක්ද ගැට ගසා ඇත. එම ලේන්සු වියා ගැනීමේ දී බෙහෙවින් භාවිත කොට ඇත්තේ රතු වර්ණයයි. ඒ හැර කහ වර්ණයට අයත් ලේන්සු ද දැකිය හැකිය. ලේන්සුව දිග හැර ත්‍රිකෝණාකාර මුල්ලට හසුවන පරිදි ග්‍රන්ථය තබා ඔතා ගනී. මධ්‍යයෙහි දී හමු වන වම් හා දකුණු පස මුලු ද ඇතුළට නවා එහි ඉතිරිය ලේන්සුව හා පොත අතරට නවා සඟවා ගනී. අවසානයෙහි නූල ගැට ගසා පොත බැඳීම අවසන් කරයි. මේ ආකාරයට නිෂ්පාදනය වී ඇති මෙම කපු රෙද්ද

"පොත් ලේන්සුව" ලෙස පුස්කොළ පොත් නිෂ්පාදන ව්‍යාපාරයෙහි දී හැඳින්වේ. පොත් ආරක්ෂා වන පරිදි තැන්පත් කිරීම සඳහා මෙවැනි ලේන්සු භාවිත කොට ඇත.

ධර්ම ප්‍රචාරක කටයුතු සඳහා පොත් රැගෙන යාමට සිදු වූ අවස්ථාවේ දී ඒ සඳහා භාවිත කළ ගමන් මල්ලක් ද තිබී ඇත. එසේ රැගෙන ගිය දික් හැඩය ගත් කොට්ට උර වැනි පසුම්බි "පොත්පැස" හෙවත් "පොත්පයි" ලෙස හඳුන්වා ඇත. පොත් මල්ල වම් උරයේ එල්ලා ගෙන යා හැකි පරිදි දිග පටියක් දමා සාදා ගත්තකි. එය චීවරයෙන් සඟවා ගෙන යා හැකි පරිදි නිමවා ඇති අතර මේවා බොහෝ විට වැඩි වටිනාකමකින් යුත් රෙදි එනම් සැටින්, වෙල්වට්, සිල්ක් වැනි රෙදි භාවිතයෙන් නිමවා ඇත. මිල අධික රෙදි භාවිතයෙන් මෙම පොත් මලු වියා ගැනීම චාරිත්‍රයක් වශයෙන් පැවති බව ද අන්ද්‍රියාස් නෙල් මහතා පවසා ඇත.

මේ අනුව බලන කල රෙදි විවීමේ කර්මාන්තයද මේ සඳහා දායක වී ඇති බව පෙනේ. මෙසේ වියා ගන්නා ලද ලේනසු හා මලු ඉතා අලංකාර, වැඩ දැමූ, ප්‍රමාණයෙන් තරමක් විශාල වූ ඒවාය.

## පුස්කොළ පොත් කියවීම

සාදා නිම කර ගත් ග්‍රන්ථය කියවීම සඳහා ද දැන සිටිය යුතුය. එය දිනට මුද්‍රණය වූ ග්‍රන්ථ කියනවාට වඩා බෙහෙවින් වෙනස් ස්වරූපයක් ගනී. එබැවින් පුරාණ පංසල් හා පිරිවෙන් ආශ්‍රිතව මෙම ග්‍රන්ථ පරිශීලනය කිරීමට කියා දෙන පැවිදි පක්ෂයේ පිරිසක්ද සිටි බව පෙනේ. පරම්පරාවෙන් පරම්පරාවට මෙම ශිල්පය හා ඥානය රැගෙන යාම සඳහා ඔවුහු පුස්කොළ පොත් පරිහරණය හා පරිශීලනය මැනවින් උගත්හ. පුස්කොළ ලේඛන කියවීමට මනා සේ උගත්තෙක් එහි කියවීමේ රටාව, ශබ්ද උච්චාරණය, විරාම ලක්ෂණ, අක්ෂර සංයෝග, අක්ෂර වර්ග, ව්‍යාකරණය, වචන, වාක්‍යය, වගන්ති, සංකේත, අංකනය, භාෂාව පුස්කොළ කියවීමේදී මව් පෙළ, දරු පෙළ, කාකපද, හංස පාද, කුණ්ඩලීය හා පෙයියාලම ආදී ඒවාට විශේෂ වූ වචන සම්බන්ධයෙන් අවබෝධයක් තිබිය යුතුය.

එපමණක් නොව පුස්කොළ පොත් කියන්නන් විසින් ග්‍රන්ථ පරිශීලනය කිරීමේ චාරිත්‍ර වාරිත්‍ර, ග්‍රන්ථ භාවිතය, එහි පත් ඉරු අංකනය, ග්‍රන්ථය හැකිලීම, හුය එතීම, ග්‍රන්ථ සංරක්ෂණය හා එය ආරක්ෂිතව තැන්පත් කරන ආකාරය පිළිබඳවත් මනා අවබෝධයක් තිබිය යුතුය. එබැවින් ඒ සඳහා ලැබිය යුතු නිසි අවධානය ලබා දීමෙන් පුස්කොළ ග්‍රන්ථ චිරාත් කාලයක් සුරැකිව තබා ගත හැකි වනවා ඇත.

## පුස්කොළ පොත් ගබඩාකරණය

අවසන මෙම ග්‍රන්ථ භාවිතයෙන් පසු පංසල්, පොත්ගුල්, විහාරස්ථාන, පුස්තකාලවල තැන්පත් කර ඇති ආකාරයත් විමසීම වටී. බොහෝ තන්හි මෙම ග්‍රන්ථ භාරව භාරකරුවෙකු හෝ භාරකාර මණ්ඩලයක් සිටිනු දැකිය හැකිය. භාවිතයෙන් පසු මෙම ග්‍රන්ථ ගබඩා කරනුයේ ලීවලින් සෑදු විශාල පෙට්ටිවලය. මෙම පෙට්ටිය "පෙට්ටගම" ලෙස හඳුන්වා ඇත. ඉබි යතුරු ලා තදින් වැසිය හැකි, තරමක් බර හා තද ලීයෙන් තැනූ පෙට්ටගම් මේ සඳහා භාවිත කොට ඇත. සමහර තැනෙක ඉතා අලංකාර චිත්‍ර හා මෝස්තර යොදා තනාගත් පෙට්ටගම් මේ සඳහා භාවිත වී ඇත.

## සමාලෝචනය

පුස්කොළ ලේඛන නිෂ්පාදන ක්‍රියාවලිය ආරම්භයේ සිට අවසාන දක්වා ඉතා විමසිලිමත්ව බැලීමේදී පෙනී යන පැහැදිලි කාරණයක් වන්නේ මෙය අද පවත්නා මුද්‍රණ ක්ෂේත්‍රයෙහි මෙන් ඉතා කෙටි කාලයකින් හා අඩු ශ්‍රමයකින් නිම කළ හැකි කටයුත්තක් නොවන බවයි. පාරම්පරිකව ඉතා සෙමින් ක්‍රියාත්මක වූ මෙම ක්‍රියාවලිය දෙස බැලීමේ දී එක් ග්‍රන්ථයක් නිපදවීම සඳහා සැලකිය යුතු කාලයක් වැය කිරීමට සිදුවන්නට ඇති බව පෙනේ. ලංකාවේ දැනට ඉතිරිව පවත්නා හා විදේශීය පුස්තකාල හා කෞතුකාගාරයන්හි ඇති පුස්කොළ ග්‍රන්ථ සම්භාරය දෙස බැලීමේ දී ක්‍රි. ව. 13- 18 සියවස පමණ වන තෙක් ලියැවී ඇති පුස්කොළ පොත් සඳහා ශ්‍රම විභජන ක්‍රියාවලිය කෙතරම් සාර්ථක අවධියක පැවතිනි ද යන්නට සාක්ෂි දරයි.

පුස්කොළ ග්‍රන්ථ සඳහා උදව් දුන් කර්මාන්ත දෙස බලන විට ඒවා කෙතරම් දුරක දියුණු මට්ටමක පැවතියාද යන්න විශ්මයජනකය. නිදසුන් ලෙස ලාක්ෂා කර්මාන්තය, කම්මල් හා වඩු කර්මාන්තය මෙන්ම අවශේෂ කණ්ඩායම්හි සාර්ථකත්වය සම්බන්ධයෙන් මෙහි ලා විශේෂ අවධානයක් යොමු කරනු වටී. මෙයට කදිම නිදසුනක් නම් දැනට ලංකාවේ ඉතිරිව පවත්නා පැරණිතම පුස්කොළ පොත ලෙස සැලකෙන ක්‍රි. ව. 13 වන සියවසට අයත් චුල්ලවග්ග පොතෙහි කම්බා සහ තල කොළ භෞතික වශයෙන් ඉතා හොඳ වට්ටමක පැවතීමයි. එයට මල් හා ලිය වැලකින් අලංකරණය කරන ලද ලී කම්බා දෙකක් හිමි අතර අද දක්වාම එහි වර්ණය හෝ තත්ත්වය නොවෙනස්ව පවතී.

බෙහෙවින්ම මෙම පුස්කොළ පොත් ක්‍රියාවලිය පන්සල් වෙහෙර විහාර ආශ්‍රිතව ඇති වූ නිෂ්පාදන ක්‍රියාදාමයක් වූයෙන් ඒ සඳහා අවට ගම්වැසියන්ගේ සහයෝගය නිබඳව ලැබෙන්නට ඇත. එමෙන්ම පංසල් පිරිවෙන් කේන්ද්‍ර කොට ගත් අධ්‍යාපනය හා සාරධර්ම ඉගැන්වීමේ ක්‍රියාදාමයත් නිසා මෙවන් වූ වැදගත් කටයුත්තක් සඳහා අවශ්‍ය ශ්‍රමය නොමිලයේම ලබා දෙන්නට ඇති බව ද සිතිය හැකිය. බුදු සමය පැතිරවීමටත් එහි ඇති සාරය මෙවන් තල්පතක ලේඛන ගත කිරීමටත් ගත් උත්සාහයට අතහිත දීමක් වශයෙන් ඔවුන් මෙම කර්තව්‍යයට නොපසුබටව සහයෝගය දීම එක්තරා පුණ්‍ය කර්මයක් සිදු කර ගැනීමක් ලෙසටද සලකන්නට ඇත. ඒ අනුව බලන කල එවක සිටි ගිහි පැවිදි මිනිසුන්ගේ සිතිවිලි හා ඥානයත් එම ග්‍රන්ථ ඒ තරම් සියුම් හා අලංකාර ලෙස නිම කිරීම සඳහා ඔවුන් සතුව පැවති හැකියාවත්, ඒ සඳහා අවශ්‍ය උපකරණ ඉතා දක්ෂ ලෙස නිපදවා ගැනීමටත් පුස්කොළ ග්‍රන්ථ කලාවටම ආවේණික වූ පාරිභාෂික ශබ්ද මාලාවක් ඇති වීමටත් තරම් දියුණු හා සහයෝගය දක්වන්නා වූ සමාජයක් තිබුණු බවට මෙය කදිම සාධකයකි. කම්මල, වඩු මඩුව, ලාක්ෂා කර්මාන්තය, කලාකරුවන්, රෙදි වියන්නන්, නූල් සපයන්නන්, හා කටින්නන් මෙන්ම අමතරව සහයෝගය දුන් පිරිස් විසින් කරන ලද මෙම කර්තව්‍යයන් ඉතා ඉහළ මට්ටමක පවතින්නට ඇත.

අද ද ලංකාවේ ඉතා කලාතුරකින් එහෙත් නානාවිධ කටයුතු සඳහා තල් කොළය ප්‍රයෝජනයට ගැනේ. තවද සමහර පළාත්හි ග්‍රන්ථ

නිෂ්පාදන හා පිටපත්කරණ කටයුතු තව දුරටත් පවත්වාගෙන යනු ලැබේ. මුද්‍රිත මාධ්‍යය දියුණුවී ඇති මෙම යුගයේ තල්පත යොදා ගෙන සිදු කරන ලද බොහෝ කර්තව්‍යයන් ඉතා කඩිනමින් හා ක්ෂණිකව සිදු කිරීමට තරම් තාක්ෂණය දියුණු වී ඇතත් තල්ගස, තල්කොළය, මෙන්ම පුස්කොළ පොත නිෂ්පාදනය සඳහා බද්ධව පැවතියා වූ මෙම ශ්‍රම විභජන ක්‍රියාවලිය දෙස බැලීමේදී ග්‍රන්ථකරණ සේවාව කොතරම් පුළුල් මට්ටමක පැවතියාද යන්නටත් සාක්ෂි ලැබේ. ඒහා බද්ධ වූ සාමූහික ප්‍රයත්නය පැසසිය යුතු කරුණක් වන හෙයින්ම වර්තමාන සමාජයත් මෙම උත්සහාය ඉතා අගය කොට සැලකීම හේතුවෙන් මේ හා බද්ධව පැවතියා වූ නොයෙක් අංශ අළලා පර්යේෂණ කටයුතු බොහෝමයක් ආරම්භ වී ඇති බව පැසසිය යුතු කරුණකි. එතරම් පැරණි ග්‍රන්ථ නිෂ්පාදන ක්‍රියාවලියක තතු තවදුරටත් ලියවෙන්නේ එය විධිමත් එමෙන්ම බෙහෝ කාලයක් පවත්වාගෙන යා හැකි වියදම් අඩු දේශීය නිෂ්පාදන ක්‍රියාවලියක් වීම නිසාවෙනි.

## ග්‍රන්ථ නාමාවලිය

1. අලහකෝන්, චම්පා එන්. කේ. "පුස්කොළ පොත් සංරක්ෂණය සඳහා යොදා ගත් පැරණි සංරක්ෂණ ක්‍රමවේදයන්'' අතිපූජ්‍ය විලපිටියේ ඥාණවංස අනුනායක ස්වාමීන්ද්‍ර අභිනන්ද ශාස්ත්‍රීය සංග්‍රහය, නිග්‍රෝධබෙත්ත මහා පිරිවෙන් ආචාර්‍ය්‍ය මණ්ඩලය, ගෙලිඔය, 2007.
2. කුලසරිය ආනන්ද, "පුස්කොළ පොත් හා ලේඛන කලාව'' සංස්කෘතික පුරාණය, 2 වෙළුම, 1 කලාපය, 1996.
3. පරණවිතාන, කේ. ඩී. 'ශ්‍රී ලංකාවේ පුස්කොළ ලේඛනවල ආරම්භය හා විකාශනය', කෞතුකාගාර 6, කලාපය, ජාතික කෞතුකාගාර දෙපාර්මේන්තුව. කොළඹ 1996.
4. රණසිංහ, සඳලාලිත් 'පුස්කොළ පොත් ලියන පංසලක හිඳ' "සිළුමිණ'' රසඳුන සීමාසහිත එක්සත් පොත් පත්‍ර සමාගම, කොළඹ 10. 2000.
5. රාමනායක, ලිලා'පර්යේෂණායතනය සතු පුස්කොළ පොත් වර්ගීකරණ කටයුතු' සමර්පණ - ආයුර්වේද පර්යේෂණ පිළිබඳ වාර ප්‍රකාශනය 6, 1998.
6. ලගමුව, ආරිය 'ශ්‍රී ලංකාවේ පුස්කොළ පොත් ලේඛන කලාව', සංස්කෘතික කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව, බත්තරමුල්ල, 2006.
7. De Silva, C. M. Austin, "Production of Book in Ancinet Ceylon",

Educatin in Ceylon: A Aentenary Volume, Ministry of Education and Cultural Affairs: Colombo. 1969.

8. De Silva, C. M. Austin, “Sinhalese National Heritage is in OlaLeaf.” The Buddhist. Vol. xviii, No. 5, Y.M. B.A. Colombo, 1947.
9. De Silva, W. A, Catalogue of Pam - Leaf Mabuscripts in the Library of the Colombo Museum, Memoris of the Colombo Museums Series A. No. Vol II, Ceylon Government Press : Colombo, 1938.
10. Gunawardhana, Siraniee, Plam- Leaf Manuscripts of Sri Lanka, Sarvodaya Vishva Lekha: Ratmalana, 1997.
11. Nell, Andreas Ceylon Palm - leaf Manuscripts Boiks, “Ceylon observer Annual”, 1932.
12. Nell, Andreas, “Palm- leaf Manuscripts or Ola Books,” Ceylon Today 3 and 4 March - April 1954.
13. Piyadasa, T. G. Libraries in Sri Lanka: Their Origin and History from Ancirnt Time to the Present Time. Sri Satguru publication: India, 1985.
14. Sirisoma, M. H. “Preparation of an Ola- leaf Books” Observer Pictorial The Associated Newspapers of Ceylon Ltd. Sri Landa, 1991.
15. Wickremartne, K. D. L. “Palm - leaf Manuscripts Ceylon” Ceylon Today 16, 1967.